# මැති ඇමැතීන් පිනවූ වන්දි හරඹය



පැවති ආණ්ඩුව වෙත ප්‍රබල මහජන විරෝධයක් මතුවිණි. එම අරගලය වඩාත් ප්‍රබල වූයේ ගාලු මුවදොර භූමියේ අරගලකරුවන් කඳවුරු බැඳීමත් සමඟිනි. ඒ අනුව එක්රුස්වූ තරුණ තරුණියන් ඇතුළු පිරිස් පසුව ප්‍රකෝපකාරීව හැසිරෙනු දක්නට ලැබිණි. අන්තිමේ දී දේශපාලනඥයන් රැසකගේ නිවාස, දේපළ, යානවාහන ආදියත් ගිනිබත් කරමින් ගෙනගිය ඒ ප්‍රචණ්ඩ තත්ත්වය තවම කාටත් අමතක නැත. මේ වනවිට ඒ මාතෘකාව නැවත කරළියට පැමිණ තිබේ. ඒ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ ප්‍රාදේශීය ක්‍රියාකාරීන්, පළාත් පාලන සහ පළාත් සභා හිටපු මන්ත්‍රීවරු පසුගිය ආණ්ඩු කාලයේදී වන්දි ලබා ගැනීමෙනි. එසේ වන්දි ලබා ගත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරු ලැයිස්තුවක් සෞඛ්‍ය සහ ජනමාධ්‍ය ඇමැති දොස්තර නලින්ද ජයතිස්ස මහතා විසින් පාර්ලිමේන්තුවේදී ප්‍රකාශයට පත් කරනු ලැබීය. එම ලැයිස්තුවට අනුව රුපියල් ලක්ෂ 5 සිට ලක්ෂ 900 ඉක්මවන වන්දි ලබා ගත් මන්ත්‍රීවරු ද වෙති. මේ ඒ පිළිබඳව එවකට ආණ්ඩු පක්ෂය නියෝජනය කළ මන්ත්‍රීවරුන් දැක් වූ අදහස්ය.

## මේ දවස්වල මීඩියාවලට එන්නේ නෑ



**කෝකිලා ගුණවර්ධන** හිටපු පා. ම

### ලක්ෂ 587

මම මේ දවස්වල මීඩියාවල කිසිම දෙයකට සම්බන්ධ වෙන්නේ නෑ. හේතුව මගේ තාත්තා නැතිවෙලා දවස් කිහිපයයි. ඒ නිසා මම ඉන්න තත්ත්වයත් එක්ක මීඩියාවලට සම්බන්ධ වෙන්නේ නෑ.

## වැරදියට වන්දි ගන්නවා නම් දේපළ රජයට ලියලා දෙනවා



**ගුණපාල රත්නසේකර** - හිටපු පා.ම.

### ලක්ෂ 14

මම අරලියගහ මන්දිරයට ගියෙත් නෑ. ගෝල්ෆේස් ගහන්න ගියෙත් නෑ. මම ඒ වෙනකොටත් ආණ්ඩුවත් එක්ක පොඩ්ඩක් හැප්පෙමින් හිටියේ. අපි ආණ්ඩුවෙන් ඉවත් වෙලා ස්වාධීන වුණොත් ඒකෙ ප්‍රතිඵලයක් හැටියට. කුරුණෑගල දිස්ත්‍රික්කයේ ජනතාව දන්නවා, මම කවුද කියලා. ජනතාව ඒ වෙලාවෙ සංවේගයට පත් වුණා, ඇයි මේ මිනිහගෙ ගෙට ගිනි තිබ්බෙ කියලා. මට තේරෙන්නෙ නෑ අදටත් ඇයි අපේ ගෙට ගිනි තිබ්බෙ කියලා.

ඔය සිද්ධියට පැය පහකට විතර කලින් මම හෙට්ටිපොළ ඕඅයිසීට කතා කරලා කිව්වා මෙහෙම සිද්ධියක් සිදු වෙමින් පවතිනවා. ඒක වළක්වන්න කියලා. නමුත් වැළැක්වූයේ නෑ. පස්සෙ මම කුරුණෑගල භාර මේජර්ට කිව්වා. එයා කිව්වා, සර් අපට ඕඩර්ස් නෑ කියලා. රජයක් වුණාම (මම මන්ත්‍රීවරයෙක් කියන එක පැත්තක තියන්න) මහජනතාවගේ දේපොළවලට වගකියන්න ඕනෙ. ආරක්ෂාව දෙන්න ඕනෙ. එහෙම දෙයක් මෙතැන සිද්ධ වුණේ නෑ.

අපට ගෙවූ වන්දියට වඩා වැඩි පාඩුවක් මේ ගිනි තැබීමෙන් සිදු වුණා. වන්දිය තක්සේරු කරන තැනටවත්, ඒ නිලධාරීන් හමු වෙන්නවත් මම ගියේ නෑ. හානිය වූ තැනට නිලධාරීන් පැමිණෙන විටත් මම ගියේ නෑ. අපේ ලේකම් කිව්වා, හානි වූ බඩු ලැයිස්තුවකට අත්සන් කරන්න කියලා. මම ඒකට අත්සන් කළා. ඒ හැර ආණ්ඩුව කියන විදියට මම කිසිම කෙනකුට බලපෑම් කළේ නෑ. එහෙම කළා කියලා ඔප්පු කළොත්, අපේ තියෙන දේපොළ රජයට ලියලා දෙනවා. අපි ව්‍යාපාර කරලා යමක් හම්බකරගෙන තමා පාර්ලිමේන්තුවට ආවේ. අපට දේපොළ තියෙනවා.

## තීරණය කළේ තක්සේරු දෙපාර්තමේන්තුවයි



**ශෙහාන් සේමසිංහ** - හිටපු රාජ්‍ය අමාත්‍ය

### ලක්ෂ 185

මිනිහෙකුට මොකක්ද තියෙන අයිතිය තවත් මිනිහෙක් ජීවත් වන තැනක් කිසිම පදනමක් නැතිව පුච්චලා, සුනුවිසුණු කරලා දාන්න. ගෙවල් පුච්චපු එක එකක්. අමතක කරන්න එපා ප්‍රේමකීර්ති අතුකෝරළ මන්ත්‍රීතුමා පාරෙ මැරුවා. මේවාට අනුබල දුන් අය අද මේවා ගැන කතා කරන එක ගැන මට පුදුමයි.

ගෙවල් ගිනි තිබ්බා විතරක් නෙමේ, කොල්ල කෑවා. එහෙමයි අපේ දේපොළ විනාශ කළේ. මේ තක්සේරුව කළේ සම්පූර්ණයෙන්ම තක්සේරු දෙපාර්තමේන්තුව. මේ දෙපාර්තමේන්තුවම තමා ඔය කියන අනෙක් තක්සේරුත් කළේ. තක්සේරුකරුවන්ට බලපෑම් කළා කියලා නලින්ද ජයතිස්ස ඇමැතිතුමා කියනවා මම දැක්කා. මම එතුමාගෙන් අහන්න කැමැතියි, අද ආණ්ඩු පක්ෂයේ ලේකම්, එදා ඔය ගෙවල් පුච්චපු අවස්ථාවේ තක්සේරු කටයුතු කළ අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් ඔහු ලවා පුළුවන් නම් කියවන්න අනුරාධපුර දිස්ත්‍රික්කයේ මැති ඇමැතිවරුන් බලපෑම් කළාද නැද්ද කියලා. මේ කළ අපරාධය කිසිම කෙනෙක් අනුමත කරන්නේ නෑ. ප්‍රචණ්ඩත්වය පතුරන සීමිත කණ්ඩායමක් තමා මේ දේ කළේ. ආණ්ඩුව කොතරම් කාලයක් පවතීද කියලා අපි බලමු. මිනිසුන්ගේ ප්‍රශ්න යටපත් කරන්න හදන්නේ මෙහෙමද ? අද හාල් නෑ. ගොවියකුට වී ටික විකුණා ගන්න බෑ. ව්‍යාපාරිකයකුට තම ව්‍යාපාරය කරගෙන යන්න බෑ. පොල් ටික විකුණන්න ක්‍රමවේදයක් නෑ. රටේ ප්‍රශ්න විසඳීම එකක්. රාජ්‍ය පාලනය තවත් එකක්. ඒක නොකර අනිත් අයට අවලාද නැඟීම තව එකක්. එතකොට මිනිස්සු බලය දුන්නේ මොකටද? ඡන්දය දුන් අහිංසක මිනිසුන්ට මොකද වෙන්නෙ.

## කතා කරල වැඩක් නෑ



**කනක හේරත්** - හිටපු පා. ම

### ලක්ෂ 292

ගිනි තිබ්බ කට්ටියගෙන් තමයි අහන්න වෙන්නෙ. ඊට වඩා ලක්ෂ දහයක වැනි මුදලක් ගෙයක් හදන්න වියදම් වෙනවා. ඒ ගැන කතා කරලා වැඩක් නෑ

## ප්‍රකාශ දෙන්න බෑ



**ඉන්දික අනුරුද්ධ** - හිටපු පා.ම

### ලක්ෂ 195

සියලු දෙනාම එකතු වෙලා මාධ්‍යයට කතා කරනවා. ඒ නිසා දැන්ම ප්‍රකාශ දෙන්න බෑ. අපි දේශපාලන පක්ෂයක් විදිහට ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ විදිහට සාමූහික තීරණය අනුව නුදුරේදීම මේ ගැන මාධ්‍යට අදහස් දක්වනවා.

## සැබෑ වටිනාකම ලැබුණේ නෑ



**ඩී. බී. හේරත්** - හිටපු රාජ්‍ය අමාත්‍ය

### ලක්ෂ 321

'අපි හරි අමාරුවෙන් බැංකු ණයක් අරන් වාරියපොළ ප්‍රදේශයේ තිබුණු අපේ ගේ හදා ගත්තේ. ඒත්, අරගලකරුවන් කළ විනාශයෙන් අපට ඉතිරි වුණේ ඇඳිවත විතරයි. අපේ පවුලේ සියල්ල ඔවුන් සුනුවිසුනු කර ගිනිබත් කර තිබුණා. පසුකාලීනව වරලත් තක්සේරුකරුවන් මගේ නිවෙසේ වටිනාකම රුපියල් ලක්ෂ 290ක් වගට වාර්තාවක් දුන්නා. ඒත්, එයින් රුපියල් ලක්ෂ 250ක් විතරයි අපිට වන්දි විදියට ලැබුණේ. ඒ හැරෙන්නට ගෙවත්තේ තිබුණු ට්‍රැක්ටර් රථ දෙකක්, ලී තොගයක් ආදියත් විනාශ කළා. මට එහි සැබෑ වටිනාකම ලැබුණේත් නැහැ. ඒ වෙනුවට ලක්ෂ 70යි ලැබුණේ. මගේ කාර්යාලයේ තිබුණු වටිනා පරිගණක, ලියකියවිලි වගේම, දරුවන් දෙදෙනාගේ පොත්පත් ඇතුළු සියල්ල විනාශ කළානේ. ඒවා අපිට මිල කරන්න බැරි තරම් වටිනා දේවල්. ඔය දේපළ, නිවාස හානි අතින් ටිකක් විතරයි.

ඊට වඩා අපිට ජීවිත තර්ජන තිබුණා. අපිව මරනවා කියලා තිබුණේ. අපි රටේ තැනින් තැන ගිහින් මගේ මිතුරන්ගේ නිවෙස්වල හැංගිලායි ඒ දවස්වල පණ බේරා ගත්තේ. අනෙක, මේ සිද්ධිවලට සැකපිට පොලීසිය අත්අඩංගුවට ගත් අය අතර මගේ ගෙදරට ගිනි තියන්නට මුලින්ම ගිනිකූර විසි කළ බව කියන තැනැත්තා අත්අඩංගුවේ සිටියදී ඔහුගේ දුක සැප බලන්නට ගියේ ඒ ප්‍රදේශයේම එක්තරා දේශපාලනඥයන් පිරිසක්.

## පොඩි වැඩක පස්සේ ගන්න



**රෝහිත අබේගුණවර්ධන** - පා.ම

### ලක්ෂ116

'මම පොඩි වැඩක ඉන්නේ පස්සේ ගන්න.' යනුවෙන් පවසා පළමු ඇමතුම විසන්ධි කළ අතර, පසුව ඇමතුම් සඳහා සම්බන්ධ කර ගැනීමට නොහැකි විය.

## මට මීට වඩා වන්දියක් ලැබෙන්න ඕනෑ



**අලි සබ්‍රි රහීම්** - හිටපු පා. ම

### ලක්ෂ709

ආණ්ඩුවෙන් වන්දි ලැබුණේ මට සිදු වූ අලාභයටයි. ඇත්තෙන්ම මට මීට වඩා ලොකු අලාභයක් සිදු වුණා ඒ අලාභයෙන් සියයට තිහක පමණ වන්දියකුයි මට ලැබුණේ. ඒත් මට මීට වඩා වන්දියක් ලැබිය යුතුයි. දේපළ ගිනි තැබීම වැරැදි දෙයක් විතරක් නොවෙයි මහ අපරාධයක්. ඒ නිසා මම සියල්ලන්ගෙන් ඉල්ලා සිටිනවා ආයේ මේ වගේ අපරාධ කරන්න එපා. දේශපාලන එදිරිවාදිකම් තිබුණට කමක් නැහැ. මේ වගේ දේවල්වලට පෙලඹෙන්න එපා කියල තමයි මම ඉල්ලා සිටින්නේ. මේ සිදුවීම්වලට සම්බන්ධ අය සොයා නිසි පරීක්ෂණ කරල වැරැදිකරුවන් වෙත දඬුවම් ලබා දෙන්න.

සමහරු කියනවා අපි එදා පැවැති ආණ්ඩුවට බලපෑම් කරලා වන්දි ලබා ගත්තා. වන්දි මුදල් වැඩි කරගත්තා කියලා. ඒත් ඒ චෝදනාව වැරැදියි. අපට නිසි වන්දි ක්‍රමවේදයක් නිසි තක්සේරුවක් තුළින් තමයි වන්දි ලබා දුන්නේ. ඒ නිසා අප ගත්ත වන්දිය වැරැදියි නැතිනම් වැඩියි කියලා චෝදනා කරන එක නිවැරැදි නැහැ.

මගේ ගෙදරට ගිනි තැබූ අය අදත් ඉන්නවා. මම විශ්වාස කරනවා දෙවියන් ඔවුන්ට දඬුවම් ලබා දේවි. ඒ විතරක් නොවෙයි මට අයිති වාහන අටක් විනාශ කළා. ඒ කිසිවකට අද දක්වා වන්දියක් ලැබිලා නැහැ. ආණ්ඩුවේ නිලධාරීන් හරි විදිහට තක්සේරු කර තමයි වන්දි ලබා දීම් කර තිබෙන්නේ. ගෙවල් විනාශ වූ වාහන විනාශ වූ යන එන මං නැති වූ අපට වන්දි අයුතු විදිහට ගත්තා කියලා චෝදනා කරන එක වැරැදියි.

## මානසික කඩා වැටීම මුදලින් මනින්න පුළුවන් ද



**මොහාන් පී.ද සිල්වා** - හිටපු පා.ම

### ලක්ෂ 601

අපි අයුතු වන්දියක් ලබා ගත්තා කියලා චෝදනා එල්ල කරන එක වැරැදියි. අපි කිසිම අයුතු වැඩක් කළේ නැහැ. නීතිය අනුව ලැබිය යුතු නිසි වන්දිය තමයි රජයෙන් ලබා දුන්නේ. තක්සේරු කිරීමක් කරන්නෙ පක්ෂයකින් නොවෙයි. රජයේ නිලධාරීන් විසිනුයි. ඔවුන් නීතියෙන් පිට වැඩ කරන්නේ නැහැ. මම නම් කිසිම නිලධාරියකුට වචනයකින් වත් බලපෑමක් කළේ නැහැ.

මම ඉල්ලා සිටිනවා මේ වන්දි දුන් ක්‍රමයේ වරදක් තිබෙනවා නම් අපක්ෂපාතීව පරීක්ෂණයක් කරන්න. මේ සියලු වන්දි අප වෙත ලැබුණේ නිසි ක්‍රමවේදය තුළයි. ඒ නිසා ඕනෑම පරීක්ෂණයකට මුහුණ දීමට මා නම් සූදානම්.

ගෙයක් ගිනි තිබ්බා කියන්නේ මුදලින් පමණක් තක්සේරු කරන්න පුළුවන් දෙයක් නොවෙයි. මානසිකව දැනෙන බලපෑම මානසික කඩා වැටීමද විශාලයි. ඒ ගැන තක්සේරු කරන එක මුදලින් කරන්න පුළුවන්ද කියලා මම ප්‍රශ්න කරනවා.

## මගේ වාහන දෙකම කෝටි 10කට වැඩියි



**අශෝක ප්‍රියන්ත** - හිටපු රාජ්‍ය ඇමැති


### ලක්ෂ 72

මීට අවුරුද්දකට කලින් මේ පිළිබඳව අපේ ආණ්ඩුව තිබෙන කාලයේදී පාර්ලිමේන්තුව වෙත සවිස්තරාත්මකව විස්තර ඉදිරිපත් කළා. ඒත්, එදා මේ වගේ ඒ දේ ආන්දෝලනාත්මක වුණේ නැහැ. වගකිව යුතු මාධ්‍ය ආයතනයක් විදිහට, වගකිව යුතු මාධ්‍යවේදියකු විදිහට ඔබ මේ ගැන නිසි දැනුම්වත් වීමකින් නොසිටීම ඔබේ වරදක්.

මම රාජ්‍ය ඇමැතිවරයකු විදිහට කටයුතු කරද්දී මේ ගැන වචනයක් කියලා බලපෑමක් කර නැහැ. මෙම දේපළ හානි කිරීම නිසා මට වඩා පාඩුවක් වුණේ රජයටයි. මගේ නිල රථ දෙකක් තිබුණා, ඒ නිල රථ දෙකම ප්‍රචණ්ඩකාරීන් විනාශ කරනු ලැබුවා. ඒ වාහන දෙකේ වටිනාකම රුපියල් කෝටි දහයකට වැඩියි. ඒ නිසා මගේ දේපළවලට වඩා හානිය වෙලා තියෙන්නේ රජයේ දේපළවලට ඒ නිසා ආණ්ඩුව කළ යුත්තේ වල්පල් ගැන කියවන එක නවත්වලා විනාශ වූ රජයේ දේපළ ගැන තක්සේරු කරලා සැකකරුවන් වෙත නඩු පවරා සැකකරුවන්ගෙන් අවශ්‍ය කරනු ලබන වන්දි ප්‍රතිපූර්ණය කර ගැනීමටයි. ඔවුන් සතුව මුදල් නැති නම් දේපළ හෝ පවරා ගෙන වන්දි මුදල් අය කර ගන්න ඕනෑ.

මගේ නිවෙසට අරගලකරුවන් පහර දෙද්දී මගේ දරුවන් වෙත ලොකු මානසික පීඩාවක් ඇති වුණා.

## මට වඩා වන්දි ගන්න අය ඉන්නවා



**ගීතා කුමාරසිංහ** - හිටපු රාජ්‍ය ඇමතිනී

### ලක්ෂ 09

ලක්ෂ 09යි මට ලැබුණේ. වහලයටම ලක්ෂ 25ක් වියදම් වුණා. මට වඩා වන්දි ගත්ත අය ඉද්දිදී මගේ ලක්ෂ 09 ගත්ත එක ගැන කතා කරනවා.

## ගිනි තියපු අයගෙන් අයකර ගන්න



**මිලාන් ජයතිලක** - හිටපු පා.ම

### ලක්ෂ 223

අපේ වන්දි තක්සේරු මුදලින් සුළු ප්‍රමාණයක් තමයි අපිට තාම හම්බවෙලා තියෙන්නෙ. ඒවා ඉක්මනින් ගෙවන්න කියලා තමයි කියන්න තියෙන්නෙ. අනික සාමාන්‍ය මිනිස්සුන්ගෙත් ගෙවල් වාහන විශාල විදියට විනාශ වුණා. අපේ ඒවා ගෙවන්න කලින් සාමාන්‍ය මිනිසුන්ගේ ඒවා ගෙවන්න. ගිනි තියපු අය උසාවියට ඉදිරිපත් කරලා තියෙනවා. මගෙත් පූගොඩ උසාවියේ දැනට නඩුව යනවා. සාක්ෂි සහිතව වීඩියෝ පට එක්ක හැම දේම තියෙනවා. ගිනි තියපු අයගෙන් මේවට අයකරගන්න ආණ්ඩුව දැනගන්න ඕනි.

## වන්දිය ප්‍රමාණවත් නෑ



**ප්‍රේමනාත් සී. දොලවත්ත** - හිටපු පා. ම

### ලක්ෂ 23

මම නිරායුද අරගලයට චෝදනා කරන්නේ නැහැ. එහෙත් ප්‍රති විරුද්ධ අදහස් දරන දේශපාලන මතධාරීන් විනාශ කිරීමට උත්සාහ කළ අරගලය නිසා තමයි අපේ නිවෙස් විනාශයට පත් වුණේ. දේපළ විනාශයට පත් වුණේ. නිවෙසක් කියන්නේ බිත්ති හතරක් නොවෙයි. එහි වටිනා දේපළ තිබෙනවා. මගෙත් ලොකු වටිනාකමක් සහිත දේවල් විනාශ වුණා. මට ලැබුණ වන්දිය ආයෙ ආයෙ කියන්න දෙයක් නොවෙයි. ඒක ප්‍රමාණවත් නෑ. ප්‍රසිද්ධ කරුණක්. අපි කිසිදු නිලධාරියෙකුට බලපෑම් කරලා වන්දි අරන් නැහැ. සාධාරණව අපට සිදු වුණ හානිය වෙනුවෙන් තමයි අපට වන්දි ලැබුණේ. ඒ නිසා ආණ්ඩුව නැවත නැවත මේ ගැන මතු කරන්න දෙයක් නැහැ.

## අලාභය ගෙවපු ගාණට වඩා වැඩියි



**විමල් වීරවංශ** - හිටපු අමාත්‍ය

### ලක්ෂ 29

මුලින්ම මේ සම්බන්ධයෙන් ප්‍රකාශ ලබාගත යුත්තේ ගිනි තියපු අයගෙන්. අරගලය වෙලාවේ ගෙවල් ගිනි තියපු අයගෙන් වැඩි පිරිසක් ජනතා විමුක්ති පෙරමුණේ සාමාජිකයො කියලා පසුව සිදුකරන ලද පරීක්ෂණ, විමර්ශනවලින් අනාවරණය වුණා.

ඒ වගේම මගේ නිවසේ අලාභය ගත්තම ඔය කියන ගාණට වඩා වැඩියි. නමුත් අපට ලබාදුන්න මුදල වන්දිය ලෙස ගත්තා. ඒ වගේම මේ මුදල් නැවත අයකර ගන්න ඕනනම් කළ යුත්තේ ගෙවල් ගිනි තියපු අයගෙන් අයකර ගන්න එක. එහෙමත් නැත්තම් ගිනි තියපු අයගේ දේපළ රාජසන්තක කරන එක. ගෙයක් කියලා කියන්නේ බිල්ඩිම, ගොඩනැඟිල්ල විතරක් නෙවෙයි. ඒක ඇතුළේ තව ගොඩක් දේවල් තිබෙනවා. කසාද සහතික, උප්පැන්න සහතික, සමරු සටහන්, සිහිවටන. දරුවන්ගේ ඡායාරූප, විවාහ ඡායාරූප. මේ හැම දේම තිබෙන්නේ ගෙවල් ඇතුළේ. ඒවා මිල කරන්න බැහැ. ඒවා පිළිබඳව සංවේදී නොවන අයකුට, සංවේදි නොවන පක්ෂයකට ඕවා ඒ තරම් දේවල් කියලා නොසිතෙන්නට පුළුවන්. නමුත් මේ හැම දෙයක්ම අදාළ අයට වටිනවා.

ඒ නිසා පීඩාවට පත්වූවන්ට වන්දි ලබාදීම ගැන කතා කරන්නට කලින් වන්දි ලබාදෙන තැනට ගෙවල් ගිනි තියපු අය ගැන කතා කළ යුතුයි.

## ගිනි තිබ්බේ සීයා හදපු ගෙදර



**දුමින්ද දිසානායක** - හිටපු ප.ම

### ලක්ෂ 288

ගිනි තිබ්බේ අපේ සීයා හදපු ගෙදර. ඒ ගෙදර ගිනි තියපු නිසානේ ගෙවන්න වුණේ. මේ ගෙවල් ගිනි තියන්න මුල්වුණේ කවුද?. ඒ නිසා දැන් පවතින ආණ්ඩුව මේ මිලියන එක්දහස් ගණන හරි, කීය හරි ජනතාවගේ සල්ලි, එහෙමත් නැත්තම් වන්දිය වැඩි කර ගත්තා කියලා හරි, නිලධාරීන්ට හරි කාටහරි චෝදනා කරනවානම් මේ මුදල් අය කරගත යුත්තේ කාගෙන්ද?

මේ සෑම නිවසක්ම ගිනි තියපු සිදුවීම් සම්බන්ධයෙන් යම් යම් නඩු තිබෙනවා. මගේ ගෙදර ගිනි තියපු සිදුවීමට අදාළවත් හතර පස් දෙනෙක් රිමාන්ඩ් කරලා හිටියා. ඒවා වෙනුවෙන් නඩුත් පවරා තිබෙනවා. ඒ නිසා මේ නඩු ටික කඩිනමින් අවසන් කරලා ගිනි තියපු අයගෙන් මේ මුදල් ටික අය කර ගත යුතුයි. වෙන කාගෙන්වත් නෙවෙයි. ගිනි තියපු නිසානේ ආණ්ඩුවට වන්දි ගෙවන්න සිදු වුණේ. අනිත් එක ස්වාභාවික විපතක් වෙනවා කියන එක සාමාන්‍යයෙන් සිදුවිය හැකි දෙයක්. නමුත් මේක සැලසුම් කරලා සිදු කරපු දෙයක්.

## මැදමුලන සොහොනට වන්දි ගත්තේ නෑ



**චමල් රාජපක්ෂ** - හිටපු අමාත්‍ය

### ලක්ෂ 65

මෙම සිදුවීම් සම්බන්ධයෙන් පැමිණිලි දාලා තිබෙනවා. පොලිසිය විමර්ශන කරල, තක්සේරු කරලා තමයි වන්දි මුදල් ලබාදීමට තීරණය කළේ. ආණ්ඩුව ගත්ත තීරණයක් අනුව තමයි මෙම වන්දි මුදල් ලබාදීමට තීරණය කළේ. මේ සිදුකළ සිදුවීම්, ඒ කියන්නේ ගෙවල් ගිනි තැබීම්, කුඩු කිරීම්, විනාශ කිරීම් ආදිය සම්බන්ධයෙන් සොයා බැලීම සඳහා ආණ්ඩුව විසින් කමිටුවක් පත් කළා.

ධාරා විජේසිංහගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත් කර තිබුණා. ඒ කමිටුව විසින් මේ සියලු දේවල් පරීක්ෂා කරලා තමයි අදාළ වන්දි මුදල් ලබා දුන්නේ. මම නම් ඊට අදාළ අයදුම්පත යොමු කළා. එච්චරයි. ලබා දුන්න මුදල ගත්තා. හදන්න ගියා ඊට වඩා වියදමක්. මැදමුලනේ ගෙදර රත් වීදුරු ජනෙල් පවා කුඩු කළා. නමුත් ඒවාට අදාළව අපි අයදුම්පත් දැම්මෙත් නැහැ. ඒ වගේම මැදමුලන සොහොනත් කුඩු කළා. එය ආන්දෝලනයට ලක්වුණු එකක් නිසා ඒක දැම්මෙත් නැහැ. සියලු දේවල් විනාශ කළා , ගිනි තියලා.

ආණ්ඩුව ප්‍රතිපත්තිමය තීරණයක් ගත්තට පසුවයි මේවාට අදාළ ගෙවීම් සිදු කර තිබෙන්නේ. ගෙවල් ගිනි තියන්න බැහැනේ. අරගලය වෙලාවේ ගෙවල් ගිනි තිබ්බේ එදා ආණ්ඩු පක්ෂයේ සිටි මැති ඇමැතිවරුන්ගේ නිවාස. ඒකට අදාළව යම් සාධාරණයක් සිදු කර තිබෙනවා. මේ අය පොදු දේපළ මොන තරම් විනාශ කළාද? හිතමතාම සිදු කළ දේවල්. මගේ නිවෙස කුඩුකළාට අමතරව කොල්ල කෑවා.

**එස්.එම්. චන්ද්‍රසේන, ගාමිණී ලොකුගේ, ප්‍රසන්න රණතුංග, ජයන්ත කැටගොඩ, ප්‍රසන්න රණවීර, කෙහෙළිය රඹුක්වැල්ල, සුමිත් උඩුකුඹුර, වෛද්‍ය රමේෂ් පතිරණ, සනත් නිශාන්ත බිරිය, සහන් ප්‍රදීප්, අකිල එල්ලාවල, ජනක බණ්ඩාර තෙන්නකෝන් යන අයගෙන් ද ප්‍රකාශ සඳහා සම්බන්ධ කර ගැනීමට උත්සාහ කළ ද නොහැකි විය.**

**ස්වර්ණා විජේකෝන්, උදිත ගුණවර්ධන, දිල්හානි ජයවර්ධන, නුවන් මහේෂ් ජයවික්‍රම, නිසංසලා කොට්ටගස්වත්ත, ඉරෝෂා දීපානි, බිනූ දිලාරා**